සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

# අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - I පත්‍රය | කාලය පැය 1

නම / විභාග අංකය ......................................................................................................

**සැලකිය යුතුයි.**

**(i)** සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

**(ii)** අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

**(iii)** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**(iv)** එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

(1) ආර්ථිකයක නිපදවන භාණ්ඩ හා සේවා යොදාගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම,

(1) නිෂ්පාදනයයි (2) බෙදාහැරීමයි

(3) පරිභෝජනයයි (4) අවශ්‍යතාවයයි

(2) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,

(1) ජනාධිපති ඇතුළු මන්ත්‍රී මණ්ඩලය යි (2) අගමැති ප්‍රමුඛ ඇමති මණ්ඩලය යි

(3) ජනාධිපති ප්‍රමුඛ ඇමති මණ්ඩලය යි (4) ඇමතිවරු ඇතුළු මන්ත්‍රී මණ්ඩලය යි

(3) සන්ධීය රාජ්‍යයන්හි මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර ඇතිවන ගැටලු නිරාකරණය සිදු කරනු ලබන්නේ,

(1) විධායකය මගිනි (2) ව්‍යවස්ථාදායකය මගිනි

(3) ඉහළ අධිකරණ ආයතන මගිනි (4) ප්‍රාන්ත අධිකරණ මගිනි

(4) සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් අංගයක් වන්නේ,

(1) කැබිනට් ආණ්ඩු ක්‍රමය (2) රාජ්‍ය මන්ත්‍රණ සභාව

(3) ආණ්ඩුකාර ධූරය (4) මූලික අයිතිවාසිකම්

(5) ජාතික රාජ්‍යය බිහි වීමට බලපෑ සාධකයක් වන්නේ,

(1) යුධ හා නාවික ශක්තිය (2) ජාතික ඒකාග්‍රතාව

(3) කාර්මික විප්ලවය (4) පුනරුදය

(6) ද්වි පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටක් වන්නේ,

(1) කොරියාව (2) කියුබාව (3) ප්‍රංශය (4) එක්සත් රාජධානිය

(7) සේවක හා සේවා යෝජක කණ්ඩායම් අතර ඇතිවන වෘත්තීයමය ආරවුල් නීතිමය රාමුවක් තුළ විසඳා ගැනීමට කටයුතු කිරීම හැඳින්වෙන්නේ,

(1) සමථකරණය ලෙසය. (2) බේරුම්කරණය ලෙසය

(3) විනිසීම ලෙසය (4) උපදේශනය ලෙසය

(8) මහේස්ත්‍රාත් අධිකරණ සඳහා විනිශ්චයකාරවරුන් පත් කරනු ලබන්නේ,

(1) ජනාධිපති විසිනි (2) රාජ්‍ය සේවා කොමිසම විසිනි

(3) අධිකරණ සේවා කොමිසම විසිනි (4) නීතිපති විසිනි

(9) යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) එංගලන්තය හා ප්‍රංශය (2) ඉතාලිය හා ජර්මනිය

(3) ස්විස්ටර්ලන්තය හා ඕලන්දය (4) පෘතුගාලය හා ස්පාඤ්ඤය

(10) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් වර්ග කළ හැකි ප්‍රධාන තේමා වන්නේ,

(1) පොදු උපයෝගිතා සේවා, බදු පැනවීම හා මහජන සෞඛ්‍ය

(2) නඩත්තු කිරීම්, විදුලිය ලබා දීම හා ගොඩනැගිලි ඉවත් කිරිම

(3) ජල සම්පාදනය, විදුලිය ලබා දීම හා ගොඩනැගිලි ඉවත් කිරීම

(4) පොදු මංමාවත්, මහජන සෞඛ්‍ය හා පොදු උපයෝගිතා සේවා

(11) ළමයින්ට උපරිම යහපත සැලසීම වෙනුවෙන් පාර්ශවකාර රාජ්‍යයන් විසින් ඉටු කළ යුතු වගකීමක් වන්නේ,

(1) අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම

(2) සන්නද්ධ අරගල සඳහා යොදා ගැනීමට පුහුණු කිරිම

(3) ළමා ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම

(4) පවුල් පරිසරය යහපත් වූ දරුවනට ආරක්ෂාව ලබා දීම

(12) මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමට ක්‍රියා කරනු ලබන ආර්ථික ක්‍රමය කුමක් ද?

(1) වෙළඳපොළ (2) සමාජවාදී (3) මිශ්‍ර (4) ධනවාදී

(13) බදු කුලී, සහ වැටුප යන ගෙවීම් කරනු ලබන නිෂ්පාදන සාධක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) භූමිය, ප්‍රාග්ධනය (2) භූමිය, ශ්‍රමය

(3) ශ්‍රමය, ප්‍රාග්ධනය (4) භූමිය, ව්‍යවසාය

(14) ජාතික මට්ටමින් පවතින ගැටුම්කාරී තත්වයන් සැලකෙන්නේ,

(1) වාර්ගික ගැටුම් ලෙසය (2) ආගමික ගැටුම් ලෙසය

(3) සූක්ෂම ගැටුම් ලෙසය (4) සාර්ව ගැටුම් ලෙසය

(15) ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයකු සතු විය යුතු සමාජීය ගුණාංග පමණක් ඇතුළත් පිළිතුර කවරක් ද?

(1) ඵලදායී සංනිවේදනය හා ඉවසීම (2) සවන්දීම හා ආත්මාවබෝධය

(3) සහනුභූතිය හා පරිත්‍යාගශීලී බව (4) අවිහිංසක බව හා අන් අයට ගරු කිරීම

(16) විසිරී ඇති නිෂ්පාදන සාධක එකතු කර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මෙහෙයවීම,

(1) නිෂ්පාදනය වේ (2) බෙදා හැරීම වේ

(3) වෙළඳාම වේ (4) ව්‍යවසායකත්වය වේ

(17) දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් රටක සිටීමෙන්,

(1) සාමකාමී මැතිවරණ වාතාවරණයක් ගොඩනැගිය හැකි වේ

(2) පහසුවෙන් විධායකය ඉවත් කළ හැකි වේ

(3) මැතිවරණයට කණ්ඩායමක් ලෙස ඉදිරිපත් විය හැකි වේ

(4) විරුද්ධ පක්ෂයට ආණ්ඩුව විවේචනය කළ හැකි වේ

(18) ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටු කර ගැනීම,

(1) සදාචාර සංවර්ධනය යි (2) සමාජ සංවර්ධනය යි

(3) ධරණීය සංවර්ධනය යි (4) පුද්ගල සංවර්ධනය යි

(19) අධිකරණමය ක්‍රියාවලියකින් යුතු නීතියේ ප්‍රතිපාදන අනුව තීන්දු ලබා දෙන ගැටුම් නිරාකරණය සඳහා යොදා ගන්නා සම්ප්‍රදායික ක්‍රමවේදය වන්නේ,

(1) උපදේශනය යි (2) මැදිහත්කරණය යි

(3) විනිසීම යි (4) සාකච්ඡාව යි

(20) සංවර්ධන මිනුමක් ලෙස ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය පමණක් භාවිත කිරීම සුදුසු නො වන්නේ,

(1) ආර්ථිකමය තොරතුරු පමණක් සැලකීම නිසා ය

(2) සමාජීය තොරතුරු පමණක් ඉදිරිපත්වීම නිසා ය

(3) සමාජ සුභසාධන තොරතුරු දැක්වීම නිසා ය

(4) ජීවන තත්වය මැන බැලෙන නිසා ය

(21) ආර්ථික අරමුණු පදනම් කර ගනිමින් ලෝකයේ පළමුව බිහි කරගත් කලාපීය සංවිධානය වන්නේ,

(1) යුරෝපා හවුල (2) යුරෝපා ආර්ථික ප්‍රජාව

(3) ආසියාන් සංවිධානය (4) සාර්ක් සංවිධානය

(22) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවේ ඇතුළත් වැදගත්ම ලක්ෂණය මින් කවරක් ද?

(1) සමානුපාතිකනියෝජනය හඳුන්වාදීම (2) ඔම්බුඩ්ස්මන් ධූරය හඳුන්වාදීම

(3) මූලික අයිතිවාසිකම් ඇතුළත් කිරීම (4) සර්ව ජන ඡන්දබලය හඳුන්වා දීම

(23) පරිසරය සම්බන්ධ පුරවැසි යුතුකමක් වන්නේ,

(1) පරිසර හිතකාමී ජීවන ක්‍රමයක් අනුගමනය කිරීම ය

(2) සංවර්ධනයේ දී පරිසර පිරිවැය තක්සේරු කිරීම ය

(3) පුරවැසි ආකල්ප සංවර්ධනයට නීති සැකසීම ය

(4) පරිසර ආරක්ෂණ ප්‍රමිතීන් හඳුන්වා දීම ය

(24) ජල දූෂණය නිසා ඇති වියහැකි ගැටලුවක් වන්නේ

(1) පසෙහි භෞතික ගුණය පිරිහීමට ලක්වීම ය

(2) ඕසෝන් ස්ථරයට හානිදායක ප්‍රතිඵල අත්වීම ය

(3) පිරිසිදු ජලය ලබා ගැනීමට අධික පිරිවැයක් දැරීමට සිදුවීම ය

(4) ජලජ ශාක හා සත්ව ප්‍රජාව සීඝ්‍රයෙන් වර්ධනය වීම ය

(25) ඇමෙරිකා එක්සත් ජනපද සන්ධීය රාජ්‍යයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) නිවාස ඉදිකිරීම (2) පළාත් පාලනය (3) මහා මාර්ග (4) බදු පැනවීම

(26) පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ,

(1) අගමැතිවරයා විසිනි (2) ජනාධිපතිවරයා විසිනි

(3) මැතිවරණ කොමිසම විසිනි (4) මැතිවරණ කොමසාරිස්වරයා විසිනි

(27) සන්ධීය රාජ්‍යයක මූලිකම ලක්ෂණය වන්නේ,

(1) විමධ්‍යගත කරන ලද බලතල නැවත ලබා ගත හැකිවීම

(2) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර රාජ්‍යයේ බලය බෙදී තිබීම

(3) ව්‍යවස්ථාදයක, විධායක, අධිකරණ බලතල මධ්‍යම ආණ්ඩු මගින් ක්‍රියාවට නැගීම

(4) මූල්‍ය සම්පත් ප්‍රාන්ත ආණ්ඩු වෙත පමණක් ලබා දීම

(28) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් අනුබද්ධ ආයතනය මින් කුමක් ද?

(1) ආසියාන් සංවිධානය (2) කොළඹ ක්‍රමය

(3) උන්ක්ටාඩ් සංවිධානය (4) ලෝක කම්කරු සංවිධානය

(29) පෘතුවියේ අන්තර්ගත ජීවී අජීවී සමස්තය අයත් වන්නේ,

(1) ස්වාභාවික පරිසරයටය (2) සංස්කෘතික පරිසරයටය

(2) සමාජීය පරිසරයටය (4) මානව පරිසරයටය

(30) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ, දෙවන වෛකල්පිත සම්මුතිය සම්මත කර ගනු ලැබුවේ,

(1) කාන්තා අයිතිවාසිකම් සුරැකීම අරමුණු කර ගෙන ය

(2) සමාජීය ආරක්ෂාව ලැබීමට ඇති අයිතිය අරමුණු කර ගෙන ය

(3) මරණ දඬුවම අහෝසි කිරීමේ අරමුණු ඇතිව ය

(4) අසාධාරණකම් මානව හිමිකම් කමිටුවට පැමිණිලි කිරීමේ අරමුණු ඇතිව ය

(31) වෙළඳපොළ ආර්ථිකයක දැකිය හැකි අහිතකර ලක්ෂණයක් වන්නේ,

(1) පාලන නීතිරීති අවම කිරීම (2) පෞද්ගලික ආයෝජන දිරිගැන්වීම

(2) සෘණ බාහිරතා නොසැලකීම (4) වෙළඳපොල බාධා ඉවත් කිරීම

(32) රටක මූලික නීතියට ඇතුළත් කර ඇති අයිතිවාසිකම් හඳුන්වන්නේ,

(1) මානව අයිතිවාසිකම් යනුවෙනි (2) සිවිල් අයිතිවාසිකම් යනුවෙනි

(3) සමාජීය අයිතිවාසිකම් යනුවෙනි (4) මූලික අයිතිවාසිකම් යනුවෙනි

(33) පරිසරයට හානි පැමිණවීම නිසා අත්වන ප්‍රතිඵල කිහිපයක් පහත දැක්වේ.

A වර්ෂණ ක්‍රියාවලිය වෙනස්වීම

B සමාජ දුරාචාර වැඩිවීම

C සාගර ජල මට්ටම ඉහළ යාම

D අම්ල වැසි ඇතිවීම

ඉහත ප්‍රතිඵල අතරින් දේශගුණ වෙනස්වීම් නිසා ඇතිවන ප්‍රතිපල දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A හා C (2) B හා D (3) A හා D (4) C හා D

(34) මැතිවරණයකින් පසු තේරී පත්වන පාර්ලිමේන්තුවේ පළමු කාර්යය වන්නේ,

(1) ජනාධිපති පත් කර ගැනීම යි (2) කථානායකවරයකු පත් කර ගැනීම යි

(3) අගමැති පත් කර ගැනීම යි (4) ලේකම්වරයෙකු පත් කර ගැනීම යි

(35) පොසිල ඉන්ධන, සුළං බලය, ජල විදුලිය යන බලශක්තීන් අයත් වන්නේ පරිසරයෙන් ලැබෙන,

(1) ජීව උපකාරක සේවාවන් වලට ය (2) ආර්ථික උපකාරක සේවාවන්වලට ය

(3) සමාජ උපකරක සේවාවන් වලට ය (4) අපද්‍රව්‍ය අවශෝෂණ සේවාවන් වලට ය

(36) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමයකු වශයෙන් හඳුනා ගැනීමට භාවිත කරන වයස් සීමාව කොපමණ ද?

(1) වයස අවුරුදු 18 ට අඩු (2) වයස අවුරුදු 16 ට අඩු

(3) වයස අවුරුදු 14 ට අඩු (4) වයස අවුරුදු 12 ට අඩු

(37) පහත ''අ'' තීරුවේ සඳහන් අධිකරණ ආයතන, සමඟ ''ආ'' තීරුවේ ඇති නඩු කටයුතු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| (1) ශ්‍රේෂ්ඨාධිකරණය | A රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ නඩු |
| (2) අභියාචනාධිකරණය | B ජනමත විචාරණ පෙත්සම් |
| (3) මහාධිකරණය | C දරුකමට හදාගැනීම පිළිබඳ ඉල්ලීම් |
| (4) දිසා අධිකරණය | D පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් |
| | E වාණිජ ආරවුල් විසඳීම |

(1) B D A C (2) D C B A (3) C B D A (4) E D A C

(38) ඡන්ද කොට්ඨාස අනුව නියෝජිතයන් පත් කර ගැනීම නිසා අත්වන වාසියක් වන්නේ,

(1) ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩ සැලසීම ය

(2) අත්තනෝමතික පාලනයකට ඉඩ සැලසීම ය

(3) වාර්ගික නියෝජනයට අවස්ථා ලැබීම ය

(4) සාමකාමී මැතිවරණ සඳහා ඉඩ සැලසීම ය

(39) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදයක බලයක් වන්නේ,

(1) ජනමත විචාරණයකින් සම්මත වූ පනතක් නීතිගත කිරීම

(2) ආණ්ඩුව ගනු ලබන තීරණ විවේචනය කිරීම

(3) නීති සම්පාදනය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම

(4) සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ලෙස කටයුතු කිරීම

(40) පහත A හා B ප්‍රකාශ සලකන්න

A සෑම මූලික අයිතිවාසිකමක්ම මානව අයිතිවාසිකමක් වන අතර සෑම මානව අයිතිවාසිකමක්ම මූලික අයිතිවාසිකමක් නොවේ.

B මානව අයිතිවාසිකම් කිසිදු අයුරකින් වර්ග කර දැක්විය නොහැකිය.

මෙම ප්‍රකාශ අතරින්,

(1) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය ය

(2) A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය ය

(3) B සත්‍ය වන අතර A අසත්‍ය ය

(4) A සත්‍ය වන අතර B අසත්‍ය ය

(ලකුණු 1×40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - II පත්‍රය | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය ..........................................................................................................

- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න**

(1) (i) මානව සංවර්ධන දර්ශකය මැනීමට භාවිත කරන නිර්ණායක දෙකක් ලියන්න.

(ii) ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ක්‍රම දෙක නම් කරන්න.

(iii) නීතියේ ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(iv) තිරසර සංවර්ධනය ළඟා කර ගැනීමේ දී පරිසර සංවර්ධනයට අදාළව මුහුණ දීමට සිදුවන අභියෝග දෙකක් ලියන්න.

(v) ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප දෙක නම් කරන්න.

(vi) ඒකීය ආණ්ඩු ක්‍රමයක් පවත්වා ගෙන යාමේ වාසි දෙකක් ලියන්න.

(vii) සමාජ සාධාරණත්වය ගොඩනැගීම බිඳ වැටීමට බලපා ඇති හේතු දෙකක් ලියන්න.

(viii) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ix) නූතන රාජ්‍යයන්හි බලය බෙදා හැරීමට බලපා ඇති හේතු දෙකක් ලියන්න.

(x) අන්තර් ජාතික වෙළඳාම සිදුවන ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(ලකුණු $2\times10 = 20$)

(2) ''ප්‍රජාතන්ත්‍රවාදය යහපත් පාලන ක්‍රමයක් ලෙස ලෝකයේම පිළිගැනීමට ලක්ව ඇත්තේ ජනතා සහභාගිත්වය මත සිදුවන නිසාය''

(i) තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න (ලකුණු 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා නිදහස් ජනමාධ්‍ය මගින් ඉටුකළ යුතු කාර්යයන් තුනක් සඳහන් කරන්න.

(b) ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(3) ''රටක් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් පිරිස් ජීවත් වුද සියලු දෙනාම එක් ජාතියක් සේ සැලකේ''

(i) බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික ජන සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් දක්වන්න.

(b) ඉන් එක කරුණක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(4) ''සියලු දෙනාම නීතියේ රැකවරණය සඳහා අයිතිවාසිකම් ලබති''

(i) නීතියේ මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) නීතිපති තුමාගේ කාර්යයන් දෙකක් ද,

(b) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් ද සඳහන් කරන්න. (ලකුණු 05)

(5) ''ගැටුමෙන් තොරව ජීවත් වීම ජනතාවගේ මෙන්ම රටේ දියුණුවට ද හේතුවේ''

(i) ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන මූලයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගන්නා සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමෙන් අත්වන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

(b) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(6) ''රටවල් අතර පවතින සහයෝගය මිනිසාගේ දියුණුවට අවශ්‍ය වේ.''

(i) රාජ්‍ය අතර සාමකාමී සබඳතා පවත්වනු ලබන මාධ්‍යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමේලා බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) ජාත්‍යන්තර සබඳතා තුළින් ශ්‍රී ලංකාවට බලපෑම් කළ හැකි ක්ෂෙත්‍ර තුනක් සඳහන් කරන්න.

(b) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(7) ''මිනිසාගේ ජීවන තත්වයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සංවර්ධනය යි.''

(i) සංවර්ධනය වෙමින් පවතින රටවල ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ දැකිය හැකි සංවර්ධිත ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාව සංවර්ධන අභියෝග ජය ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න.

(b) ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)
## 11 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය I පත්‍රය පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | - | 3 | (21) | - | 2 |
| (2) | - | 2 | (22) | - | 3 |
| (3) | - | 3 | (23) | - | 1 |
| (4) | - | 1 | (24) | - | 3 |
| (5) | - | 4 | (25) | - | 4 |
| (6) | - | 4 | (26) | - | 2 |
| (7) | - | 2 | (27) | - | 2 |
| (8) | - | 3 | (28) | - | 4 |
| (9) | - | 1 | (29) | - | 1 |
| (10) | - | 4 | (30) | - | 3 |
| (11) | - | 1 | (31) | - | 3 |
| (12) | - | 2 | (32) | - | 4 |
| (13) | - | 2 | (33) | - | 1 |
| (14) | - | 4 | (34) | - | 2 |
| (15) | - | 3 | (35) | - | 2 |
| (16) | - | 4 | (36) | - | 1 |
| (17) | - | 1 | (37) | - | 1 |
| (18) | - | 3 | (38) | - | 1 |
| (19) | - | 3 | (39) | - | 1 |
| (20) | - | 1 | (40) | - | 4 |

(01 × 40 = 40)

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## 11 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය II පත්‍රය පිළිතුරු

(1) (i) උපතේදී ආයු අපේක්ෂාව, අධ්‍යාපනය, ක්‍රය ශක්තිය

(ii) රාජ්‍ය උපාය සබඳතා, යුධ උපාය සබඳතා

(iii) යුක්ති සහගත හා සාධාරණ වීම

නිරවුල්ව හා පැහැදිලිව දැක්විය යුතු වීම

නීති කඩකිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම

අධිකාරී බලය පදනම් කරගෙන රාජ්‍ය විසින් ම පනවන්නක් වීම

(iv) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය

වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

(v) පරිසර හිතකාමී සම්පත් පරිහරණය

සෞන්දර්යාත්මක බව රැක ගැනීම

මිහිතලයට දැරිය හැකි සංවර්ධනය

(vi) ඉක්මනින් හා පහසුවෙන් තීරණ ගත හැකි වීම

බලය ක්‍රියාවට නංවන ආයතන දෙකක් නොමැති නිසා ගැටුම් අවම වීම

පරිපාලන හා අධිකරණ ක්‍රමය සමස්ත පද්ධතියට ම පොදු වීම

(vii) රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂම බව

නිලධාරීවාදය

අල්ලස හා දූෂණය ඉහළ යාම

අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම

රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම

(viii) වැඩ ලෝකය පුළුල්වීම

ගෝලීය වෙළඳපොළ පුළුල්වීම

ඕනෑම රටක ජීවත් විය හැකිවීම

අඩුම ළමා ශ්‍රමය ලබා ගත හැකි රටවලට කර්මාන්ත සංක්‍රමණය

(ix) ජාතික ආරක්‍ෂාව තහවුරු කර ගැනීම

විවිධත්වය තුළ එක්සත් බවත් ගොඩනගා ගැනීම

රාජ්‍යයේ විශාලත්වය නිසා එක් ස්ථානයක සිට පාලනය අපහසු වීම

(x) ද්වි පාර්ශවික

බහු පාර්ශවික

(ලකුණු 02 × 10 = 20)

(2) (i) මහජන මතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම
බහුවිධතාව තුලින් එක්සත් බව ගොඩනැගීම
ආණ්ඩුවේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය තුළින් නිවැරදි කිරීමට අවස්ථාව ලබා දීම
ජන සමාජයේ විවිධත්වය නිරූපණයට ඉඩ ලැබීම

(ලකුණු 02)

(ii) පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්‍ෂා වීම
පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ පාලක පාලිත දෙපක්‍ෂයම දැනුවත් වීම
නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම
මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම
අධිකරණයේ ස්වාධීනත්වය සුරක්‍ෂිත වීම ........... ආදිය

(ලකුණු 03)

(iii) (a) සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාවට සැපයීම
ජනතාවගේ දැනුම වර්ධනය
අපක්‍ෂපාතීව සමාජයේ යහපැවැත්මට හිතකර තොරතුරු සැපයීම

(b) පාලකයින් ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට යොමු කිරීම
කාලීන තොරතුරු නිසි වේලාවට ලබා දීම

(ලකුණු 03 + 02 = 05)

(3) (i) විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරණ විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත්වීම
ඒ ඒ සංස්කෘතීන්ට ආවේනික සිරිත් විරිත් පද්ධතියක් තිබීම
එකම ජන කොටසක වුවද ප්‍රාදේශීය විවිධත්වයක් තිබීම
තාක්‍ෂණය, සන්නිවේදන දියුණුව හා ගෝලීයකරණය ආදිය නිසා සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීම.

(ලකුණු 02)

(ii) අන් ආගම්වලට අවමන් නොකිරීම, අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම
අන්‍ය මත ඉවසීම හා ගරු කිරීම
සමානාත්මතාවය
සාමූහිකත්වය වර්ධනය
අන් භාෂා ඉගෙනීම හා භාවිතය ..... ආදී

(ලකුණු 03)

(iii) (a) ජාතික සමගිය සහජීවනය වර්ධනය වේ
ගැටුම් අවම වේ
මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ

(b) එක් ජාතියක් එක් රටක් යන හැඟීම වර්ධනය වේ
අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ යන ආදී කරුණු

(ලකුණු 03 + 02 = 05)

(4) (i)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- අධිකරණ තීන්දු
- සිරිත් විරිත්
- විවිධ අණපනත්
- නීති විශාරද මත හා විද්‍යාත්මක සිද්ධාන්ත
- ආගම

(ලකුණු 02)

(ii)
- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම
- නීතිය පිළිබඳ සෑම පුරවැසියෙකුටම අවබෝධයක් තිබීම
- නීතිය ඉදිරියේ සැම දෙනාම සමාන ලෙස සැලකීම
- විනිශ්චයකාරවරුන්ට තීන්දු ගැනීමේ දී බලපෑම් නොකිරීමට ආදී කරුණු

(ලකුණු 03)

(iii)(a) විනිශ්චයකාරවරු පත් කිරීම, ඉවත් කිරීම, විනිශ්චයකාරවරුන් ගේ වැටුප්
ඒකාබද්ධ අරමුදලින් ගෙවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වීම

(b) අධිකරණ සේවා කොමිසම පිහිටුවීම
අනවශ්‍ය මැදිහත්වීම් හා පාලනය කිරීම සීමා කිරීම
වෙනත් තනතුරු පිළිගැනීම නොකළ යුතු බව (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වීම)

(ලකුණු 03 + 02 = 05)

(5) (i) වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ ආර්ථික තත්ත්ව

(ii) සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමුවීම
ක්ෂණික විසඳුම් ලැබීම
පෞද්ගලික හෝ විශ්වාස මට්ටමින් සිදුවීම
වියදම් අවම වීම
දෙපාර්ශවයටම ''ජය - ජය'' විසඳුම් ලැබීම

(ලකුණු 03)

(iii)(a) ජීවිත හානි අවම වීම
සම්පත් හා දේපළ හානි වැළකීම
මානසික ආතතිය අවම වීම

(b) මූලික හා මානව අයිතීන් ආරක්ෂා වීම
දේශපාලන ස්ථාවර බව ඇතිවීම
ආර්ථික ස්ථාවර බව
ආත්ම ගෞරවය සුරැකීම ......... ආදී

(ලකුණු 05)

(6) (i) ජාත්‍යන්තර වෙළදාම, තානාපති සේවය

(ලකුණු 02)

(ii) සම්පත් විසංතුලනය
අතිරික්ත නිෂ්පාදන අලෙවිකර ගැනීම
ප්‍රවාහන හා සන්නිවේදනයේ දියුණුව
දියුණු තාක්ෂණය ලැබීමේ අවශ්‍යතා
ආපදා හා විපත් අවස්ථාවලදී සහාය ලබා ගැනීම

(ලකුණු 03)

(iii) (a) ජාත්‍යන්තර වෙළඳාම
(b) ණය හා ආධාර ලබා දීම
ජාතික ආරක්ෂාව, රැකියා සැපයීම, ආර්ථික ක්ෂේත්‍රය

(7) (i) ළදරු මරණ අනුපාතිකය ඉහළය
භෞතික ජීවන තත්ව දර්ශකය පහළය
ඒක පුද්ගල ආදායම පහළය
තාක්ෂණය භාවිතය අඩුය
විදේශ විනිමය ඉපයීම වැඩිය
ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩිය

(ලකුණු 02)

(ii) සාක්ෂරතා මට්ටම ඉහළ ය
ආයු අපේක්ෂාව ඉහළ ය
ළදරු මරණ හා මාතෘ මරණ අනුපාතිකය පහළ ය

(ලකුණු 03)

(iii) (a) සංචාරක කර්මාන්තය දියුණු කිරීම
දේශීය, විදේශීය, ආයෝජන දිරිගැන්වීම
දේශීය ඉතුරුම් දිරි ගැන්වීම

(b) අපනයන විවිධාංගීකරණය
අපනයන අභිමුඛ කර්මාන්ත දිරි ගැන්වීම
දේශපාලන ස්ථාවරත්වය ගොඩනැගීම .......... ආදී කරුණු

(ලකුණු 05)

******